C
377
KAL

" ජාතික පොදු සහතික පත්‍ර විභාගය
හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)
විභාගයේ නිර්නායක වලංගුතාවය පිළිබඳ තුලනාත්මක
අධ්‍යයනයක් "

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

පුෂ්පා ලක්ෂ්මී තළුආරච්චි
විසිනි.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ
අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය
සම්බන්ධ අවශ්‍යතා අර්ධ වශයෙන් පූරණය
කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන
පර්යේෂණාත්මක නිබන්ධයකි.

1982 ජූලි

නිබන්ධ උපදේශක

ආචාර්ය එම්.යූ. යේදර.

367468

## සාරාංශය.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හා ජා.පො.ස විභාගයන් අ.පො.ස. (උසස් පෙළ) සමඟ දක්වන නිර්නායක වලංගුතාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් මෙම පර්යේෂණයෙන් කෙරේ. ශ්‍රී ලංකාවේ පශ්චාත් ද්විතීයික අධ්‍යාපනය හා අ.පො.ස (උසස් පෙළ) සඳහා සුදුස්සන් තේරීම කෙරෙනුයේ අ. පො.ස. (සාමාන්‍ය පෙළ) හා ජා.පො.ස වැනි සහතික පත්‍ර විභාගයන්හි ප්‍රතිඵල සලකා ගෙනය. අ.පො.ස (සාමාන්‍ය පෙළ) හා ජා.පො.ස. විභාගයන් පශ්චාත් - ද්විතීයික අධ්‍යාපනය කෙරෙහි දක්වන වලංගුතාව විමසීම මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වේ.

1972 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය මගින් අ.පො.ස (සාමාන්‍ය පෙළ) ට අමතරව ජා.පො.ස විභාගයද අ.පො.ස (උසස් පෙළ) පාඨමාර්ග හැදෑරීමට සුදුසුකම් ලබන සමාන්තර පරීක්ෂණ ලෙස යොදා ගැණින. එසේම අ.පො.ස (උසස් පෙළ) හැදෑරීමට ඇතුළුවීමද අ.පො.ස (උසස් පෙළ) විභාගය සමත්වීමද, තරඟකාරී විය. ඉන් විවිධ මත භේද අධ්‍යාපනික ක්ෂේත්‍රය තුළ හටගෙන ඇතත් මෙතෙක් එම විභාග ගැන පර්යේෂණාත්මකව සොයා බැලීමක් සිදුවී ඇත්තේ ඉතා සුළු වශයෙන් පමණි.

පරීක්ෂණයක් ඉන් අපේක්ෂිත කාර්ය කොතෙක් දුරට සාර්ථකව ඉටු කරන්නේද, එම පරීක්ෂණවල වලංගුතාව හා විශ්වාශ්‍යතාව කවරේද යන්න සොයා බැලීම අත්‍යවශ්‍ය වුවත්, ඒ පිළිබඳව යොමු වී ඇති අවධානයද ප්‍රමාණවත් නොවේ. මෙකී අවශ්‍යතාවයන් ඉතා අල්ප වශයෙන් හෝ පූර්ණය කිරීමේ අභිලාශයෙන් මෙම පර්යේෂණය කෙරිණ.

පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පුස්තකාලය
1984-3-13
පේරාදෙණිය

මහනුවර අධ්‍යාපන දිස්ත්‍රික්කයේ මහනුවර නගරය තුළ ප්‍රසිද්ධ විද්‍යාලයන් හතරකද , මහනුවර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මට්ටමේ මධ්‍ය මහා විද්‍යාල හා මහා විද්‍යාල හයකද, ගැහැණු හා පිරිමි ළමුන් 400 කට කිට්ටු සංඛ්‍යාවක ශිෂ්‍යයින් මෙම පර්යේෂණය සඳහා යොදා ගැනින.

එම ශිෂ්‍යයින්ගේ විභාග ප්‍රතිඵල මෙහිදී සංඛ්‍යා විද්‍යාත්මක විශ්ලේෂණයකට ලක් කෙරේ. අ.පො.ස ( සාමාන්‍ය පෙළ ) හෝ ජා.පො.ස. විභාගය, අපේක්ෂකයාගේ ග්‍රාමීය/ නාගරික බව, හා ස්ත්‍රී/පුරුෂ භාවය, යන සාධක විද්‍යා හා වාණිජ යන විෂය සන්ධාර තුල විමසීමට ලක්විය. විශ්ලේෂණය මගින් ලැබූ පර්යේෂණ ප්‍රතිඵල සාරාංශය වශයෙන් මෙසේය.

1. සමස්ථව ගත් විට අ.පො.ස ( සාමාන්‍ය පෙළ ) හා ජා.පො.ස. විභාග අ.පො.ස ( උසස් පෙළ ) පරීක්ෂණ ප්‍රතිඵල සමග අඩු සහසම්බන්ධතාවක් දක්වයි. එම විභාගයන්හි නිර්නායක වලංගුතාව ඉතාමත් හීන බැව් පෙනීයේ.

2. නිර්නායක වලංගුතාව හීන තත්වය විද්‍යා හා වාණිජ්‍ය විෂය සන්ධාරයන් දෙකෙහිම දක්නට ලැබේ.

3. අ.පො.ස. ( සාමාන්‍ය පෙළ ) හෝ ජා.පො.ස. විභාග ප්‍රතිඵල අ.පො.ස ( උසස් පෙළ ) විභාගයට පෙනී සිටිය හැකි දෙවතාවෙන් ප්‍රථම වතාව සමග වැඩි නිර්නායක වලංගුතාවක් දක්වන බවට සුළු හෝ නැඹියාවක් ඇත.

4. අ.පො.ස ( සාමාන්‍ය පෙළ ) විභාගයට වඩා ජා.පො.ස විභාගය අ.පො.ස ( උසස් පෙළ ) ප්‍රතිඵල සමග වැඩි නිර්නායක වලංගුතාවක් දැක්වේ.

5. අ.පො.ස. ( සාමාන්‍ය පෙළ ) විභාගය මෙන්ම ජා.පො.ස. විභාගයද ග්‍රාමීය ළමුන්ට වඩා නාගරික ළමුන් කෙරේ වැඩි නිර්නායක වලංගුතාවක් පෙන්වා ඇත.

6. අ.පො.ස ( සාමාන්‍ය පෙළ ) විභාගය හා ජා.පො.ස. විභාගය විද්‍යා විෂය සන්ධාරයේදී ගැහැණු ළමුන් කෙරේද, වාණිජ්‍ය විෂය සන්ධාරයේදී පිරිමි ළමුන් කෙරේද වඩාත් වැඩි නිර්නායක වලංගුතාවක් දැක්වේ.

7. අ.පො.ස ( සාමාන්‍ය පෙළ ) හා ජා.පො.ස. විභාගයන්හි විෂය සන්ධාරයන් අතර වාණිජ්‍ය විෂය සන්ධාරයට වඩා වැඩි නිර්නායක වලංගුතාවක් විද්‍යා විෂය සන්ධාරය කෙරේ දක්වා ඇත.

8. අ.පො.ස. ( සාමාන්‍ය පෙළ ) හා ජා.පො.ස විභාග ප්‍රතිඵල වලින් අ.පො.ස. ( උසස් පෙළ ) ප්‍රවේශය සඳහා යොදා ගැනෙන නිර්නායක විෂයයන්හි වලංගුතාව සලකා බැලූ විට එකී නිර්නායක විෂයයන් අ.පො.ස. ( උසස් පෙළ ) ප්‍රතිඵල කෙරේ විශේෂ වූ නිර්නායක වලංගුතාවක් නොදක්වන බැව්ද මෙම අධ්‍යයනයෙන් අනාවරණය වී ඇත.